# <u>උපදෙස් පත්‍රිකාව</u>

මාගර්ගත ක්‍රමය යටතේ අස්ථානගත වූ/ සොරකම් කරන ලද ජංගම දුරකතන තොරතුරු ඇතුලත් කිරීමේදී පහත උපදෙස් අනුව කටයුතු කල යුතුය.

- තිරයේ සඳහන් තොරතුරු ඇතුලත් කිරීමේදී පැමිණිල්ල * සලකුණින් සඳහන් තොරතුරු අනිවායර්යෙන් ඇතුලත් කල යුතුය.
- තත්ත්වය පරීක්ෂා කිරීමට හෝ පැමිණිල්ල තහවුරු කරගන්නා අවස්ථාවේ දුරකතන අංකයට OTP අංකයක් ලැබෙන බැවින් පැමිණිල්ල අවසානයේ ඇතුලත් කරන දුරකතන අංකය සඳහා වලංගු දුරකතන අංකයක් යොමු කල යුතුය.

**සිද්ධියට අදාල පොලිස් ස්ථානය :** ජංගම දුරකතනය අස්ථානගතවූ / සොරකම සිදුවූ පොලිස් වසම සඳහන් කල යුතුය.

**පැමිණිලි වගර්ය:** අස්ථානගතවූ / සොරකම් කරන ලද

**පැමිණිල්ල :** පැමිණිල්ල කෙටියෙන් සඳහන් කරන්න

**ඉමී අංකය:** අංක 15කින් සමන්විත ඉමී අංකය හෝ ඉමී අංක ඇතුලත් කරන්න. අවම වශයෙන් එක් ඉමී අංකයක් හෝ තිබිය යුතුය. ඉමී අංක එකකට වඩා ඇතුලත් කිරීමේදී කොමා(,) මගින් වෙන් කරන්න.

**සිදුවූ දිනය සහ වේලාව :** සිද්ධිය සිදුවූ දිනය සහ වේලාව ආසන්න වශයෙන් හෝ සඳහන් කරන්න

**ඇමුණුම:** ගොනුවක් තිබෙනම් ඇමුණුම් කරන්න.

**ජාතික හැඳුනුම්පත් අංකය/විදෙස් ගමන් බලපත් අංකය :** වලංගු ජාතික හැඳුනුම්පත් අංකයක් / විදෙස් ගමන් බලපත් අංකයක් අනිවායර්ය වේ.

**නම :** දුරකතනය හිමිකරුගේ නම සඳහන් කරන්න.

**දුරකතන අංකය :** පැමිණිලිකරු සම්බන්ධ කරගත හැකි වලංගු දුරකතන අංකයක් සඳහන් කරන්න.

**විද්‍යුත් තැපැල් ලිපිනය:** විද්‍යුත් තැපැල් ලිපිනයක් තිබේ නම් පමණක් සඳහන් කරන්න.

**ලිපිනය :** තොරතුරු දැනුම් දීම සඳහා ලිපිනය සඳහන් කරන්න.

 **මා විසින් සපයන ලද තොරතුරු මා දන්නා තරමින් සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදක් විය හැකි බවත්, ඒ සඳහා මා වගකිව යුතු බවත් මම පිළිගනිමි.** (ඔබ ලබා දී ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට පිළිගෙන මෙහි සඳහන් වාක්‍යට ඉදිරියෙන් ඇති හිස් කොටුව මත ක්ලික් කරන්න.)

අවසානයේ “පැමිණිල්ල ඉදිරිපත් කරන්න” මත ක්ලික් කරන්න.

- පැමිණිල්ල තහවුරු කිරීම සඳහා පැමිණිලිකරු ලබාදෙනු ලබන දුරකතන අංකයට OTP අංකයක් ලැබෙන අතර එම අංකය පද්ධතියට ඇතුලත් කර තහවුරු කිරීම සිදු කල යුතුය.
- පැමිණිල්ල නිසියාකාරව යොමු වී ඇත්නම් පැමිණිලිකරුගේ ජංගම දුරකතනය වෙත ලැබුනු බවට කෙටි පණිවිඩයක් ලැබෙනු ඇත.

**දැනටමත් පැමිණිල්ලක් ගොනු කර තිබේද?**

- එසේනම්, එම පැමිණිල්ලේ වතර්මාන තත්වය පරීක්ෂා කිරීමට “තත්වය පරීක්ෂා කරන්න ” මත ක්ලික් කරන්න.
- OTP අංකයක් ඔබගේ දුරකතන වෙත ලැබෙනු ඇත. එම අංකය සටහන් කිරීමෙන් අනතුරුව පැමිණිලිකරු යොමු කරනු ලැබූ පැමිණිල්ලේ වතර්මාන තත්වය පරීක්ෂා කර ගැනීමට හැකිවනු ඇත.